# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2363/70 – 2023 දෙසැම්බර් 22 වැනි සිකුරාදා – 2023.12.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2018/262.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2021.03.02 වැනි දින අංක 2217/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.02.22 වැනි දින දරන නියෝගයෙන්,

පී. ජී. නන්දන කුමාර බණ්ඩාර මයා, වම්බටු යාය, හුංගන්වෙල, නාලන්ද.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර පවත්නා 2021.02.19 වැනි දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ එල්. ඒ. එම්. නිමල් අබේසිංහ මයා වෙත යොමු කරන ලදී.


1A – G 41091 – 14 (2023/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරු නීතීඥ එල්. ඒ. එම්. නිමල් අබේසිංහ මයා එම ධූරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළ යුතු යැයි පෙනී යන හෙයින්, කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2021.02.22 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 දෙසැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 0331/1

---

මගේ අංකය: IR/COM/02/2018/262.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිසංශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

පී. පී. නන්දන කුමාර බණ්ඩාර මයා, වම්බටු යාය, හුංගන්වෙල, නාලන්ද.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

නීතීඥ ජනජිත් ද සිල්වා මහතා, නො. 09, උසාවිය පාර, ගම්පහ.

පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 දෙසැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2018/262.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

පී. පී. නන්දන කුමාර බණ්ඩාර මයා, වම්බටු යාය, හුංගන්වෙල, නාලන්ද.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මාතලේ, කලුදැවල, ප්‍රාදේශීය වැඩපලේ සේවය කරන ලද පී. ජී. නන්දන කුමාර බණ්ඩාර මහතාට 2008.10.13 දින සිට 2015.03.07 දින දක්වා වැඩ තහනම් කර සිටි කාලයට අදාළව වැටුප් නොගෙවීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමි විය යුතු සහන කවරේ ද යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 12 - 0331/2

---

මගේ අංකය: IR/COM/02/2021/42.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ජේ. පී. බන්දුල මයා, අංක 44/5, මානිම්මුල්ල, අම්බලන්ගොඩ.
2. එච්. එම්. ගුණදාස මයා, අංක 6, විජය ගාර්ඩන්, මානාන, අගලවත්ත.
3. එස්. ඩබ්. ආර්. වීරකෝන් මයා, අංක 119/8/1/ඒ, වේරගොල්ල, පුවක්පිටිය.
4. වයි. ජී. චන්දන කුමාර මයා, අංක 202/ඒ, බේරුගොඩ වත්ත, උළුවිටික, ගාල්ල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, තැ. පෙ. 21, නාවල පාර, නුගේගොඩ.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධන මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

අහමඩ් ලෙබ්බේ මොහමඩ් සලීම් මයා, අංක 46/7, ඇසළ උද්‍යාන පාර, ඔබේසේකරපුර, රාජගිරිය.

පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනුෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 දෙසැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2021/42.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිසංශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. ජේ. පී. බන්දුල මයා, අංක 44/5, මානිම්මුල්ල, අම්බලන්ගොඩ.
2. එච්. එම්. ගුණදාස මයා, අංක 6, විජය ගාර්ඩන්, මානාන, අගලවත්ත.
3. එස්. ඩබ්. ආර්. වීරකෝන් මයා, අංක 119/8/1/ඒ, වේරගොල්ල, පුවක්පිටිය.
4. වයි. ජී. චන්දන කුමාර මයා, අංක 202/ඒ, බේරුගොඩ වත්ත, උළුව්ටික, ගාල්ල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, තැ. පෙ. 21, නාවල පාර, නුගේගොඩ.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ

"ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ආරක්ෂක සේවයේ පහළ ශ්‍රේණිය තනතුරේ සේවය කරන සේවකයින් ඉහළ ශ්‍රේණිය තනතුරට උසස් කිරීමේ දී පහළ ශ්‍රේණිය තනතුරේ වැඩිපුර කාලයක් ගත කිරීම අනුව වසර දෙකෙන් දෙකට එක් වැටුප් වර්ධකයක් බැගින් 2013 වසරේ සිට 2018 වසර දක්වා වසර 5 ක් ලබා දුන් වැටුප් වර්ධක වාසිය ඉවත් කිරීම හා අය කර ගැනීම මඟින් ආරක්ෂක සේවයේ

සේවය කරන ජේ. පී. බන්දුල මයා ඇතුළු සේවකයින් 04 දෙනා සඳහා අසාධාරණයක් සිදුව තිබේ ද අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේ ද යන්න පිළිබඳව වේ.''

1. ජේ. පී. බන්දුල මයා
2. එච්. එම්. ගුණදාස මයා
3. එස්. ඩබ්. ආර්. වීරකෝන් මයා
4. වයි. ජී. චන්දන කුමාර මයා

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේදී දින යොදන ලදී.

EOG 12-0332

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.